# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2356/30 - 2023 නොවැම්බර් මස 03 වැනි සිකුරාදා - 2023.11.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති, ලියාපදිංචි අංක පී. වී. 7161 දරන සහ වර්තමානයේ අංක 185, කොස්වත්ත පාර, රාජගිරිය යන ලිපිනයෙහි පිහිටා ඇති සමාගමක් වන ගේට්වේ කොලේජ් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් එකී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, උසස් අධ්‍යාපනය වැඩි දියුණු කිරීමේ කාර්යය සඳහා මෙහි II වන උපලේඛනයේ II වන තීරයේ නිශ්චිතව දක්වා ඇති කෙටි යෙදුමට අනුරූපීව මෙහි II වන උපලේඛනයේ I වන තීරයේ දක්වා ඇති උපාධිය ප්‍රදානය කිරීම සඳහා යොමු කරන්නා වූ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් ගේට්වේ කොලේජ් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය මෙම නියමය මගින් පිළිගනු ලැබේ.

**I වන උපලේඛනය**

***කොන්දේසි***

1. (මෙහි මින්මතු ''ආයතනය '' යනුවෙන් සඳහන් කරනු ලබන) ගේට්වේ කොලේජ් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින්, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධි පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී, අවම අධ්‍යයන සම්භාර 120 ක් සහිත (එස්. එල්. කියූ. එෆ්. 6 වන ස්ථරයේ) අධ්‍යාපනවේදී ගෞරව උපාධිය සම්බන්ධයෙන්,

    a. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී කවර හෝ විෂයය ධාරාවකින් අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (එස්) තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම ;

යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතුය.

2. ආයතනය විසින් මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධියට සම්බන්ධ උපාධි පාඨමාලාව අංක 185, කොස්වත්ත පාර, රාජගිරිය ශ්‍රී ලංකාව යන ස්ථානයේ පමණක් පැවැත්විය යුතුය.

3. ආයතනය විසින්, මෙම නියමය ප්‍රකාශයට පත්කළ දිනයේ සිට සෑම වසර පහකට (5) වරක් නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන සමාලෝචනයට යටත්ව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධිය පිරිනැමිය යුතු ය.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**II වන උපලේඛනය**

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා වන කෙටි යෙදුම* |
|---|---|
| අධ්‍යාපනවේදී ගෞරව | බීඊඩී ගෞරව |

ආචාර්ය **ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත,**
අධ්‍යාපන අමාත්‍ය.

2023 ඔක්තෝබර් මස 31 වැනි දින,
කොළඹ දී ය.

EOG 11 - 0027

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.